**ආයුර්වේද වෛද්‍ය සභාව - 2017**

**---------------------------------------------**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11 සිට 21 දක්වා වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සභාවේ සභාපති වෙත 2018 ජුනි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 . මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**-------------------------------------------**

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත** 1

**--------------------------------------------**

(i) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු නමුත්, රු.368,900 ක් වූ වෛද්‍ය සහතික පොත් 1054 ක අලෙවි ආදායමට එරෙහිව එම පොත්වල මුද්‍රණ වියදම වූ රු.50,592 ක් හිලව් කර රු.318,308 ක් වූ ශුද්ධ ආදායම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සභාව වෙත ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත** 7

**--------------------------------------------**

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසු වුවත් ඊට පටහැනිව සභාව විසින් වත්කම මිලදීගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිගණක පද්ධතිය අළුත්වැඩියා කිරීම හා තිරරෙදි ඇමීම වෙනුවෙන් ගෙවිය යුතු රු.113,570 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රජයේ ප්‍රදාන රු.6,750,000 කින් රු. 6,000,000 ක් පමණක් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර රු.750,000 ක් සංචිත හා ප්‍රාග්ධන ගිණුමට බැර කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ II (1) (ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු හා අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ එක් ආචාර්යවරයෙකු සභාවේ සාමාජිකයකු ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයින් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට රු.6,168,201 ක් වූ දේපල පිරියත හා උපකරණ පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2018 මැයි 30 දින වන විටත් පවත්වා නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වාදී තිබුණු නිර්දේශයන් 2018 මැයි 10 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය. | වෛද්‍ය සභාවේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන ලේඛකාධිකාරී තනතුරට අවශ්‍ය බඳවාගැනීමේ පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ඉක්ම වූ වෛද්‍යවරු 15,727 ක් ලියාපදිංචිය අළුත්කර නොතිබුණු අතර ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අහිමිව තිබුණු ආදායම රු.16,530,750 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,476,904 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,153,359 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,630,263 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේ ගාස්තු සියයට 50 කින් හෙවත් රු.3,819,131 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.1,575,270 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.3,371,292 දක්වා වැඩිවී තිබුණු අතර 2015 වර්ෂයේදී රු.712,624 ක් දක්වා නැවත අඩුවී තිබුණි. 2016 වර්ෂයේදී රු.1,153,359 ක් දක්වා වැඩිවී තිබුණු අතිරික්තය 2017 වර්ෂයේදී රු.1,476,904 ක ඌනතාවයක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.5,733,505 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.4,674,974 ක් දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද වෛද්‍ය සභාවේ වෛද්‍යවරු හා පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීම, විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 03 කොටසෙහි 18 වගන්තිය ප්‍රකාරව සභාවේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍යවරුන් ලියාපදිංචි වීම සියයට 70 ක ප්‍රතිශතයකින් අඩුවී තිබුණු අතර උපාධිධාරී, පාරම්පරික සර්වාංග හා පාරම්පරික විශේෂ වෛද්‍යවරු ලියාපදිංචිය පිළිවෙලින් සියයට 70 කින් සියයට 81 කින් හා සියයට 91 කින් අඩුවී තිබුණු නමුත් ඊට හේතුවූ කරුණු අනාවරණය නොකෙරුණි.

(ii) ආයුර්වේද සාත්තු සේවකයින් (හෙද නිළධාරීන්) අවසන් වරට 2013 වර්ෂයේදී ලියාපදිංචි කිරීමෙන් පසු අලුතින් ලියාපදිංචි කර නොතිබුණි. තවද ආයුර්වේද ඖෂධ සංයෝජකයින් සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර නොතිබුණු අතර එම නිලධාරීන් සභාවේ ලියාපදිංචි කරවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය පැවැත්විය යුතු වුවත්, එම විභාගය 2018 මැයි 10 දින විටත් පවත්වා නොතිබුණි. තවද, ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී පවත්වා තිබුණු ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ව්‍යාජ වෛද්‍යවරුන් සම්බන්ධ පිළිවෙලින් පැමිණිලි 14 ක් හා පැමිණිලි 34 ක් ලැබී තිබුණි. ඉන් පිළිවෙලින් පැමිණිලි 11 ක හා 08 ක විමර්ශන කටයුතු 2018 මැයි 16 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර විමර්ෂන කටයුතු අවසන් කර තිබුණු පිළිවෙලින් පැමිණිලි 03 කට හා 26 කට අදාළව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් විමර්ශනය කළ බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකළ යුතු උපාය මාර්ග 12 කට අදාළ ක්‍රියාකාරකම් 26 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද වෛද්‍ය සභා ගොඩනැගිල්ලට විදුලි සැපයුම සිදු කරන විදුලි මීටරය සම්බන්ධ කරමින් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රියදුරු නේවාසිකාගාරය වෙත විදුලි සැපයුම ලබාදීම හේතුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාන්‍ය මාසික විදුලි බිල රු.32,503 ක් දක්වා අසාමාන්‍ය අයුරින් වැඩිවී තිබුණි.

(ආ) සභාවේ ලේඛකාධිකාරී තනතුර සඳහා 2017 අගෝස්තු 08 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරිය වෙත නිකුත් කර තිබුණු පත්වීම් ලිපිය ප්‍රකාරව ඇය සභාවේ පූර්ණකාලීනව සේවය කළ යුතු වුවද, ඇයගේ සේවයට පැමිණීම හා පිටවීම අදාළ ලේඛනයේ සටහන් තැබීම අවශ්‍ය නොවන බවට සභාව විසින් තීරණය කර තිබුණු බැවින් ඇය එම තනතුරේ පූර්ණකාලීනව රැඳී නොසිටින බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිවී සිටින වෛද්‍යවරුන්ගෙන් තොරතුරු සොයාගත නොහැකි වූ වෛද්‍යවරු 1619 දෙනෙකු පිළිබඳව සභාව අප්‍රමාදව කටයුතු නොකිරීම නිසා එම ලියාපදිංචි අංක භාවිතාකර ව්‍යාජ වෛද්‍යවරු කර්මාන්තයේ නියැලීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

## 4.3 අරමුදල් කළමනාකරණය

---------------------------

2017 ජනවාරි 01 දිනට මුදල් පොතට අනුව බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.5,406,214 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂය රු.4,339,576 ක් විය. සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය බැංකු ශේෂය රු.4,992,668 ක්ව පැවති බැවින්ද 2017 දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය 7.27 ක් වූ බැවින්ද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හැර ඉතිරි මුදල් පොලී ආදායම් ලැබෙන කෙටිකාලීන ආයෝජනවල තැන්පත් කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේදී නව සහතිකයක් නිකුත් කිරීමටත්, එම සහතික පත් 6,000 ක් මුද්‍රණය කිරීමටත් 2015 දෙසැම්බර් 18 දින පාලක සභාව තීරණය කර තිබුණි. නමුත් 2018 මැයි 10 දින වන විටත් නව සහතික පත් මුද්‍රණය කර ගැනීමට අපොහොසත්වී තිබුණු බැවින් 2015 සිට 2017 දක්වා වර්ෂවල ලියාපදිංචිය යාවත්කාලින කරගැනීමට මුදල් ගෙවා තිබුණු වෛද්‍යවරු 7,934 ක් වෙත අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීමට නොහැකි වී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රකාරව, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනකුගේ හා කාර්යාල සහායකවරයකුගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ආයුර්වේද වෛද්‍ය සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 41 ක ප්‍රමාදයක් සහිතව 2018 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් අයිතම 12 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 45 සිට සියයට 100 දක්වා පරාසයක හා වියදම් අයිතම 03 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 29 සිට සියයට 128 දක්වා පරාසයක අවාසිදායක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, සභාවේ 2015 හා 2016 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2018 මැයි 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6.4 නොවිසඳී ඇති විගණන ඡේද**

2006 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ලැබී තිබුණු එකතුව රු.9,780 ක් වූ මුදල් ඇණවුම් 27 ක් උපලබ්ධි කර නොගෙන සේවා සපයා තිබුණු අතර එම මුදල් ඇණවුම් 27 හි මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| මෙහෙයුම් පාලනය | (i) පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේදී, අයදුම්පත් භාර ගැනීම, ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම යන පියවරයන් සඳහා කාල වකවානු නිශ්චය කර ඒ අනුව කටයුතු නොකිරීම.<br>(ii) ආයුර්වේද පනත හා විනය නියෝග කාලීනව සංශෝධනය කර පැමිණිළි කඩිනමින් විමර්ශනය කළ හැකි පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම. |